**නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.70,987 ක ණයහිමි ශේෂ 02 ක් ගිණුම්ගත කර නොතිබුණි | එම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | රු.499,978 කට ඇස්තමේන්තු කර තිබුණු ඉදිකිරීමේ ව්‍යාපෘතියකට අදාළව රු. 99,996 ක අත්තිකාරම් කොන්ත්‍රාත් සමිතියට ගෙවා තිබුණද, එය රු.499,978 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.399,982 ක් ණයහිමියන් වැඩියෙන් දැක්විණි. | 2024 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදි නිවැරදි කරන බව | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට නිලධාරියෙකුගෙන් රු.32,850 ක ණය ශේෂයක් අයවිය යුතු වුවද එය රු. 185,460 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමෙන් රු.152,610 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදි නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුලියාවත්ත හා බගවන්තලාව කඩ කාමර ඉදිකිරීම සඳහා වැයකළ රු.44,933,882 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාළ වරද පිළිගන්නා අතර 2024 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදි නිවැරදි කරන බව. | වත්කම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමෙහි රු.4,786,836 ක ශේෂ තහවුරු කිරීම සඳහා ලෙජර් ගිණුම් පොත් නඩත්තු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ලෙජර් ගිණුම් සකස් කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | 371 (ආ) | 2021 දෙසැම්බර් 14 ගෙවන ලද සංවර්ධන ව්‍යාපෘතියට අදාළ රු. 99,996 ක අත්තිකාරමක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් පියවා නොතිබුණි. | ඉදිරියේදී අත්තිකාරම් පියවීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| i. | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරණ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපල තක්සේරුව වසර 05 කට වරක්වත් සිදුකළ යුතු වුවද, ප්‍රාදේශීය සභාව 2018 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන විගණිත දින වනවිටත්, වරිපනම් අය කර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්තාව ලැබීමෙන් පසු එය ලේඛණ ගත කර 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට හැකි බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.62,920,319ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,687,049 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| )i) | වරිපනම් හා බදු | 3,580,000 | 3,531,098 | 3,534,717 | 286,181 | 5,320,000 | 3,102,133 | 3,657,534 | 289,800 |
| (ii) | කඩ කුලී | 11,988,450 | 10,265,599 | 9,856,210 | 2,456,245 | 11,543,000 | 8,397,557 | 8,282,755 | 2,046,856 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,900,000 | 3,482,364 | 3,482,364 | - | 3,961,000 | 1,997,048 | 1,664,544 | - |
| (iv) | වෙනත් ආදායම් | 10,000,000 | 16,558,265 | 8,859,411 | 15,939,990 | 69,036,460 | 6,177,047 | 45,652,222 | 8,241,136 |
| | | 27,468,450 | 33,837,326 | 25,732,702 | 18,682,416 | 89,860,460 | 19,673,785 | 59,257,056 | 10,577,792 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කුලී | | |
| අඹගමුව හා බගවන්තලාව ප්‍රදේශ තුළ පිහිටි කඩ කාමර දෙකකින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.1,958,876 ක කුලී අයකර නොතිබුණි. | අය කිරීමට නඩු පැවරීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය. |

(ආ) වෙනත් ආදායම්
------------------

| | | | |
|---|---|---|---|
| i. | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභාපනතේ 154 (1) වගන්තියට අනුව, පුද්ගලික ආයතනයක් විසින් වෙන්දේසියේ විකුණන ලද ඉඩම් කොටස් 59 කින් සියයට 01 ක බදු රු. 1,517,803 ක් අයකර නොතිබුණි. | අයකරගැනීමට අවශ්‍ය නීති සම්පාදනය කරගෙන නොමැති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| ii. | සංචාරක මණ්ඩලය විසින් ලබාදුන් තොරතුරුවලට අනුව සභා බල ප්‍රදේශය තුළ සංචාරක අධිකාරියේ අනුමත හෝටල් 05 කින් වෙළඳ බලපත්‍ර ගාස්තුව ලෙස ආදායමින් සියයට එකක බදු අයකර නොතිබුණි. | සභාවේ වසර ගණනාවක් ආදායම් පරීක්ෂකවරයෙකු නොමැති වීම හේතුවෙන් මේ පිළිබඳව නඩු පැවරීමට නොහැකි වී ඇති බව | හිඟ ආදායම් අය කළ යුතුය. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.703,489 ක් හා මුද්දර ගාස්තු රු.15,236,501ක් විය. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගන්නා බව | ඉතිරි හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.

---------------------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 79 සිට 84 දක්වා වගන්තිය අනුව සභා බල ප්‍රදේශය තුළ සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් ජලාපවාහනය සම්බන්ධ කිසිඳු සංවර්ධන කටයුත්තක් ඉටුකර නොතිබුණි. | දැනට සභාවේ ප්‍රමාණවත් මූල්‍ය තත්ත්වයක් පවතින බැවින් ඉදිරියේදි එම කටයුතු ඉටු කිරීමට බලාපොරොත්තු වෙන බව | පනතින් පැවරුණ වගකීම් ඉටු කිරීම සභාව පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්තිවලට අනුව මල ප්‍රවාහන සහ කසළ ශෝධනය සඳහා ගලි රථ සේවාවක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | දැනට සභාවේ ප්‍රමාණවත් මූල්‍ය තත්ත්වයක් පවතින බැවින් ඉදිරියේදී එම කටයුතු ඉටු කිරීමට බලාපොරොත්තු වෙන බව | පනතින් පැවරුණ වගකීම් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 27 පරිච්ඡේදය අනුව සභාව සතු මාර්ග ගැසට් පත්‍රයේ එලකර නොතිබුණි. | දැනට සභාවේ ප්‍රමාණවත් මූල්‍ය තත්ත්වයක් පවතින බැවින් ඉදිරියේදී එම කටයුතු ඉටු කිරීමට බලාපොරොත්තු වෙන බව | පනතින් පැවරුණ වගකීම් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 වගන්තිය අනුව කටයුතු කර මහජනතාවට සපයන ජලය පිරිපහදු කිරීමේ ක්‍රමයක් අනුගමනය නොකර පානීය ජලය බෙදා හැර තිබුණි. | දැනට සභාවේ ප්‍රමාණවත් මූල්‍ය තත්ත්වයක් පවතින බැවින් ඉදිරියේදී එම කටයුතු ඉටු කිරීමට බලාපොරොත්තු වෙන බව | පනතින් පැවරුණ වගකීම් ඉටු කළ යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 (අ) වගන්ති අනුව අඩි 25 ක වීථිරේකා සීමාව හා 2008 දෙසැම්බර් 01 දිනැති 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 42 (2) (1) (අ) සහ (ආ) අනුව ප්‍රධාන මාර්ග අඩි 50 වීථිරේඛා සීමාව තුළ පිහිටි සැලසුම් 09 කට අදාල ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර නිකුත් කර තිබුණි. | ඉදිරියේදී ප්‍රධාන මාර්ග අඩි 50 වීථිරේඛා සීමාව තුළ පිහිටි සැලසුම් සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කරනු නොලබන බව | පනතේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 49 (අ) වගන්ති අනුව ප්‍රාදේශීය සභා පාරක ගොඩනැගිලි අවම සීමාව තුළ ඉදිකර තිබුණු ඉදිකිරීම් 07 ක නිර්වන්දි ගිවිසුමකට එළඹ නොතිබුණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබාගෙනද නොතිබුණි. | ඉදිරියේදී පනතේ විධිවිධාන අනුව කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 134 (1) හා 139 (2) වගන්ති අනුව 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ ජුනි 30 දක්වා කාලය තුළ අනුමත කළ ගොඩනැගිලි සැලසුම් 195 ක් සම්බන්ධයෙන් පසු විපරම් කර අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවන අන්දමින් කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාව සතු ඉඩම් 24 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් තක්සේරු කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව | තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

3.3 වත්කම් කළමනාකරණය
------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් බගවන්තලාව ගවඝාතකාගාරය පැවති ඉඩම, යාබද නිවසේ පුද්ගලයින් අනවසරයෙන් භුක්ති විඳින බව නිරීක්ෂණය විය. | ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් උදාවී ඇති අතර අනවසර භුක්ති විඳීම පිළිබඳව නීත්‍යානුකූලව පියවර ගැනීමට නොහැකි වී ඇති බව. | දේපලවල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිළදී ගන්නා ලද වටිනාකම රු.94,759 ක් වූ කොම්පෝස්ට් බඳුන් 19 ක් භාවිතයට නොගෙන සභා පරිශ්‍රයේ නිෂ්කාර්යව රඳවා තිබුණි. | ඉදිරියේදී බෙදා දීමට අවශ්‍ය කටයුතු කරන බව | අරමුණුගත කාර්යයට යොදවා ගත යුතුය. |
| (ඇ) | හොන්සි ජල පොම්පාගාරය, ක්ලෝරීන්කරණ කාමරය, ජල ටැංකියේ දැල් ආවරණය ප්‍රමාණවත් නොවන බැවින් ජලයට රොඩු එකතුවීමත්, ක්ලෝරීන්කරණ කාමරය භාවිතයේ නොපැවතීමෙන් හා විධිමත් ක්‍රියාවලියකට නොවන ආකාරයට ජලයට ක්ලෝරීන් දැමීමත් මත ජලය පිරිසිදු කිරීම ප්‍රමාණවත් අයුරින් සිදු වී නොතිබුණි. | මෙම ජලය ගලි රථ මඟින් ඉවත් කර පිටි පරීක්ෂා කර නැවත එය අළුත්වැඩියා හෝ ඉදිකිරීම ඉදිරියේදී සිදු කරන බව | මහජනයාට පිරිසිදු ජානීය ජලය ලබාදීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | නෝර්වුඩ් පුස්තකාලයේ වැසිකිළිය ගිලා බැසීමට ලක් වෙමින් පැවතුණද අළුත්වැඩියා කර නොතිබුණු අතර නෝර්වුඩ් පොලීසිය අසල ඉඩම ඵලදායී කාර්යයකට යොදවාගෙන නොතිබුණි. | එය කඩා ඉවත් කර නැවත ඉදිකිරීමට කටයුතු කරන බව සහ නෝර්වුඩ් පොලීසිය අසල ඉඩමේ සතිපොළක් පැවැත්වීමට කටයුතු කරන බව | සභා දේපල ආරක්ෂා කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | නෝර්වුඩ් පොදු වැසිකිළිය, ආයුර්වේදය පිහිටි වැසිකිළිය හා බගවන්තලාව බස්නැවතුම්පොල වැසිකිළියේ ගලිවලෙහි ජලය ඉක්මනින් පිරියාම හේතුවෙන් භාවිතයට යොදා ගැනීමට නොහැකිව පැවතුණි. | ඉදිරියේදී වැසිකිළි අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව | සුදුසු අළුත්වැඩියාවන් සිදුකර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සභාව සතුව පවතින වාහන 09 ක අයිතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත්, සභාව වෙත පවරාගෙන නොතිබුණි. | අඹගමුව ප්‍රාදේශීය සභාව මගින් ලබා දුන් අබලන් තත්තවයේ පවතින ටේලර් 2ක් වන අතර ඉදිරියේදි අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.4 මානව සම්පත් කළමනාකරණය
---------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 96 ක් වූ අතර තනතුරු 18 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 73 ක් පැවති අතර ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු, මුරකරු, විදුලි කාර්මික, ආදාහනාගාර ක්‍රියාකරු, කාර්යාල කාර්යය සහයක, ආදාහනාගාර සහයක යන තනතුරුවල අනුමත තනතුරු 46 ක් පුරප්පාඩු වී පැවතීම මහජන සෞඛ්‍ය, කසල කළමණාකරණය ආදී සභාවේ මූලික කාර්යයන් ඉටු කිරීමේදී බාධාවක්ව පැවතුණි. | තනතුරු 46 ක් සඳහා බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය මෙතෙක් ලැබී නොමැති හෙයින් බඳවා ගැනීමට නොහැකි වී ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය. |

3.5 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂය තුළ සිදුව තිබුණු රු.92,007 ක පුස්තකාල පොත් ඌණතාව සම්බන්ධයෙන් මු.රේ 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | භාවිතයට ගත නොහැකි පොත් පරිග්‍රහණ ලේඛනයෙන් ද ඉවත් කර ඇති අතර සමීක්ෂණ මණ්ඩලයේ සමාජිකයින් විසින් අවශ්‍ය කටයුතු සිදුකරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |